


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල හා කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සදහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සදහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැදවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (විදුලි) (කොන්ත්‍රාත් පදනම) තනතුර

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිළධාරින්ගේ උපදෙස් පරිදි කාර්යක්ෂමව හා අඛණ්ඩව සමස්ථ විදුලි බල සැපයුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම, නඩත්තු කිරීම හා සියළුම විදුලි උපකරණ, යන්ත්‍ර හා ගොඩනැගිලි වල විදුලි පද්ධති සැකසීම හා නඩත්තු කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) මැනීමේ සහ පරීක්ෂා කිරීමේ උපකරණ විධිමත්ව භාවිතා කිරීම හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම.

(II) විදුලි උපකරණ, මෙවලම් භාවිතය හා ඒවායේ ක්‍රියාකාරීත්වය හා නඩත්තුව පිළිබදව මනා අවබෝධයක් ලබා තිබීම.

(III) විදුලි කාර්මිකයින්ගේ ලොග් සටහන් පොත් දිනපතා සම්පූර්ණ කිරීම.

(IV) ගොඩනැගිලි වල විදුලි පරිපථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සදහා අවශ්‍ය නඩත්තු කටයුතු කිරීම.

(V) විදුලි කාර්මික වැඩ වල නිරතවීමේදී පුද්ගලයින්ට හා උපකරණ වලට සිදුවන අනතුරු වලක්වා ගැනීම සදහා අනිවාර්යයෙන්ම ආරක්ෂිත විධිවිධාන අනුගමනය කිරීම.

(VI) විදුලි අර්බුද අවස්ථා වලදී ගුවන් තොටුපොලේ ක්‍රියාකාරීත්වය පවත්වා ගෙන යාම සදහා සක්‍රිය ලෙස දායක වීම.

(VII) විටින් විට සිදුකළ යුතු පරීක්ෂා කිරීම් සැලැස්මට අනුව සිදු කිරීම.



**සුදුසකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ විදුලි ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02)නොඅඩු පූර්ණ කාලින පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය ආධුනිකත්ව සහතිකයක් ලබා තිබීම.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

කොන්ත්‍රාත් කාල සිමාව තුල මාසික දීමනාවක් ගෙවනු ලබන අතර කොන්ත්‍රාත් කාලය අවසානයේදී ස්ථිර සේවයට බදවා ගැනීමෙන් අනතුරුව සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**පොදු කරුණු :-**

ඉහත තනතුර සදහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සදහන් ලිපිනයට 2021 **දෙසැම්බර් මස** 16 **වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (විදුලි) (කොන්ත්‍රාත් පදනම)** යන තනතුර සදහන් කළ යුතුවේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Source: www.airport.lk (2021.12.13)